## නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කායර්ාලය - මී ඔය

## வதிவிட திட்ட முகாமையாளர் காரியாலையம் – மீ ஓய

## Resident Project Management Office – Mee Oya


**වාරිමාගර් කළමනාකරණ අංශය**
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
**Irrigation Management Division**
**වාරිමාගර් හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය**
கல்கமுவ
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
**Ministry of Irrigation & Water Resources Management**

මී ඔය
ගල්ගමුව
மீ ஓய
Mee Oya
Galgamuwa


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>15My Ref No — 018/3/1/3 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref No | දිනය<br>திகதி<br>Date — 2019.02.08 |

ව්‍යාපාර කළමනාකරණ කමිටු සාමාජික සියලුම
රජයේ නිලධාරි මහතුන් සියලුම ගොවි සංවිධාන
නියෝජිතවරුන් වෙත

**<u>මී ඔය ව්‍යාපාරයේ පෙර කන්න රැස්වීම හා ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාතර්ාව - 2019 පෙබරවාරි</u>**

1994 අංක 13 දරණ සංශෝධන පනතේ 05 වන වගන්තියේ 05 වන උප වගන්තිය යටතේ මී ඔය ව්‍යාපාරය වෙනුවෙන් 2019 යල් කන්නය සඳහා පෙර වගා රැස්වීම හා ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම 2019.02.08 වන දින පෙ.ව. 9.00 ට මී ඔය ව්‍යාපාර කළමණාකාරතුමාගේ ප්‍රධානත්වයෙන් මී ඔය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කායර්ාලයේදී පවත්වන ලදි.ආගම සිහි කිරීමෙන් හා පැමිණ සිටි සියලු දෙනා පිළිගැනීමෙන් අනතුරුව න්‍යාය පත්‍රයට අනුව රැස්වීමේ කටයුතු ආරම්භ කරණ ලදි.

සහභාගි වූ නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 01 | D.M.K.H.දිසානායක මයා | නේ:ව්‍යා:කළමණාකරු | වාරිමාගර් කළමනාකරණ අංශය |
| 02 | A.A.D.W.S.ප්‍රදීප් මයා | ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරි | ගොවිජනසේවා දෙපාතර්මේන්තුව |
| 03 | M.N.A.N.කුමාරි මිය | සංවධර්න නිලධාරි | වාරිමාගර් කළමනාකරණ අංශය |
| 04 | Y.G.N.අමරසිංහ මිය | සංවධර්න නිලධාරි | වාරිමාගර් කළමනාකරණ අංශය |
| 05 | R.M.N.K.රත්නායක මිය | සංවධර්න නිලධාරි | වාරිමාගර් කළමනාකරණ අංශය |
| 06 | H.M.C.K. හේරත් මිය | සංවධර්න නිලධාරි | වාරිමාගර් කළමනාකරණ අංශය |
| 07 | H.L.G.G.අබේවික්‍රම මිය | ඉංජිනේරු සහකාර | වාරිමාගර් දෙපාතර්මේන්තුව |
| 08 | W.A.G.P.කුමාරි මිය | ඉංජිනේරු සහකාර | වාරිමාගර් දෙපාතර්මේන්තුව |
| 09 | W.T.බුද්ධිරාජ් මයා | ඉංජිනේරු සහකාර | වාරිමාගර් දෙපාතර්මේන්තුව |
| 10 | W.M.C.L.විජේකෝන් මයා | කෘෂිකමර් උපදේශක | කෘෂිකමර් දෙපාතර්මේන්තුව |
| 11 | D.M.L.B.දිසානායක මයා | කෘෂිකමර් උපදේශක | කෘෂිකමර් දෙපාතර්මේන්තුව |
| 12 | K.M.ලක්ප්‍රිය කෝණාර මයා | කෘ.ප.නි.ස. | ගොවිජනසේවා දෙපාතර්මේන්තුව |
| 13 | P.නිරෝෂා සජීවනී මිය | කෘ.ප.නි.ස. | ගොවිජනසේවා දෙපාතර්මේන්තුව |
| 14 | J.M.A.C.සිරිකාන්ති මිය | කෘ.ප.නි.ස. | ගොවිජනසේවා දෙපාතර්මේන්තුව |

**සහභාගි වූ ගොවි නියෝජිතවරුන්**

| අනු අංකය | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| 01 | K.P.ජයරත්න මයා | සභාපති | ගැමුණු ගොවි සංවිධානය |
| 02 | K.B.A.ප්‍රේමසිරි මයා | උපලේකම් | ගැමුණු ගොවි සංවිධානය |
| 03 | H.M.T.මුතුබංඩා මයා | ලේකම් | අභය ගොවි සංවිධානය |
| 04 | N.P.හීන්බංඩා මයා | සභාපති | දකුණු ඉවුර ගොවි සංවිධානය |
| 05 | K.K.W.ධර්මකීර්ති මයා | භාණ්ඩාගාරික | දකුණු ඉවුර ගොවි සංවිධානය |
| 06 | W.M.වික්‍රමසිංහ මයා | ලේකම් | ධාතුසේන ගොවි සංවිධානය |
| 07 | I.M.ජයසේන මයා | සභාපති | මහසෙන් ගොවි සංවිධානය |
| 08 | B.A.රෝහිත උදය කුමාර මයා | භාණ්ඩාගාරික | මහසෙන් ගොවි සංවිධානය |
| 09 | J.A.සියාතුහාමි මයා | සභාපති | වළගම්බා ගොවි සංවිධානය |
| 10 | A.L.M.S.නසූදරීන් මයා | භාණ්ඩාගාරික | වළගම්බා ගොවි සංවිධානය |
| 11 | H.M.උක්කුබංඩා මයා | සභාපති | යාය 01 ගොවි සංවිධානය |
| 12 | W.M.ජයසූරිය මයා | ලේකම් | යාය 01 ගොවි සංවිධානය |
| 13 | A.ඇන්සලන් අල්විස් මයා | සභාපති | යාය 02 ගොවි සංවිධානය |
| 14 | K.G.සෝමපාල මයා | ලේකම් | යාය 02 ගොවි සංවිධානය |
| 15 | S.W.කරුණාරත්න මයා | නියෝජිත | යාය 02 ගොවි සංවිධානය |
| 16 | W.P.ප්‍රේමචන්ද්‍ර මයා | නියෝජිත | යාය 02 ගොවි සංවිධානය |
| 17 | W.සුජිත් දිනසේන මයා | සභාපති | යාය 03 ගොවි සංවිධානය |
| 18 | R.M.H.K.රත්නායක මයා | ලේකම් | යාය 03 ගොවි සංවිධානය |
| 19 | D.M.හේරත්බංඩා මයා | භාණ්ඩාගාරික | යාය 03 ගොවි සංවිධානය |
| 20 | K.චෝලක කහදවල මයා | සාමාජික | යාය 03 ගොවි සංවිධානය |
| 21 | R.U.මයිකල් විල්ප්‍රඩ් මයා | සාමාජික | යාය 03 ගොවි සංවිධානය |
| 22 | H.H.කරුණාරත්න මයා | සභාපති | යාය 04 ගොවි සංවිධානය |
| 23 | H.M.M.P.C.හේරත් මයා | ලේකම් | යාය 04 ගොවි සංවිධානය |
| 24 | P.M.ලීලානන්ද වීරසිංහ මයා | සභාපති | යාය 05 ගොවි සංවිධානය |
| 25 | H.M.කරුණාරත්න මයා | ලේකම් | යාය 05 ගොවි සංවිධානය |
| 26 | S.M.රිස්වාන් මයා | භාණ්ඩාගාරික | යාය 05 ගොවි සංවිධානය |
| 27 | K.P.ප්‍රේමදාස මයා | උපසභාපති | යාය 05 ගොවි සංවිධානය |
| 28 | W.ආරියරත්න මයා | සභාපති | යාය 06 ගොවි සංවිධානය |
| 29 | A.K.ගුණසේන මයා | ලේකම් | යාය 06 ගොවි සංවිධානය |
| 30 | W.විජේකෝන් මයා | සභාපති | පුරාණගම ගොවි සංවිධානය |
| 31 | W.M.නිමල් විජේරත්න මයා | ලේකම් | පුරාණගම ගොවි සංවිධානය |
| 32 | H.M.කවුරාල මයා | භාණ්ඩාගාරික | පුරාණගම ගොවි සංවිධානය |

පසුගිය කමිටු වාතර්‍රාව සමාලෝචනය හා එකඟතා ලබා ගැනීම

පසුගිය වාතර්‍රාවේ අඩුපාඩු කිසිවක් නොවූයෙන් රැස්වීමේ කටයුතු ඉදිරියට කරගෙන යාමට තීරණය විය.

**01.ආයතන සංවර්ධන කටයුතු- සංවර්ධන නිලධාරි**

- පසුගිය මාසයේ ප්‍රගතිය

| අනු අංකය | කාරණය | ප්‍රගතිය |
|---|---|---|
| 01 | මහ සභා පැවැත්වීම | 10 |
| 02 | කාරක සභා පැවැත්වීම | 11 |
| 03 | මුදල් සාරාංශ ලබා දීම | 16 |

❖ ඉදිරි මාසයේදී පැවැත්වීමට අපේක්ෂිත මහ සභා /කාරක සභා

| කාරණය | ඉලක්කය | වගකීම |
|---|---|---|
| මහ සභා පැවැත්වීම | 01 | නේ:ව්‍යා:කළ/සං:සභ/ සං:නි |
| නිලවරණ පැවැත්වීම | 01 | එම |
| කාරක සභා පැවැත්වීම | 16 | එම |
| මුදල් සාරාංශ ලබා දීම | 16 | එම |

**නේවාසික ව්‍යාපාර කළමණාකරු**

- ගොවි සංවිධානවල ආයතන සංවර්ධනය කටයුතු පිළිබඳව වඩාත් සැලකිලිමත් විය යුතු බවත් රැස්වීම් පැවැත්වීම විධිමත් කර ගත යුතු බවත් පවසන ලදි.
- මහ සභා රැස්වීම්,කාරක සභා රැස්වීම් පැවැත්වීමේ දී අංග සම්පූණර් රැස්වීම් එනම් පස්ගිය වාතර්ා ඉදිරිපත් කිරීම,අයවැය වාතර්ා ඉදිරිපත් කිරීම ආදිය සිදු කිරීම අත්‍යාවශ්‍ය බවට පවසන ලදි.
- මහ සභා රැස්වීම්, නිලවරණ රැස්වීම් සඳහා කැඳවීමේ ලිපි බෙදා දීමේ දී ඒ පිළිබඳව දැඩි අවධානයකින් යුතුව කටයුතු කළ යුතු බව පවසන ලදි.
- රැස්වීම් වලදී ඉදිරිපත් කරණ අයවැය ලේඛණ අභ්‍යන්තර ගණන් පරීක්ෂකවරුන් ලවා අනුමත කර ගැනීම අනිවායෙර්න්ම සිදු කල යුතු බව පවසන ලදි.
- සෑම ගොවි සංවිධානයකම ලොග් සටහන් පොතක් පවත්වාගෙන යාම අනිවායෙර්න් සිදු කල යුතු බව ද පැවසීය.
- නිලවරණයකදී ගොවි සංවිධානවල පොත්පත් ලේඛණයක් සාදා ගත යුතු බවත් නිලවරණ දිනයේදී ගොවි සංවධාන නිලධාරීන් එම ලේඛණයේ ඇති පොත්පත් සියල්ල නිලවරණ දිනයේ දී රැගෙන ආ යුතු බවත් නිලධාරීන් වෙනස් උවහොත් එදිනම පොත්පත් භාර දීම සිදු කල යුතු බවත් බවසන ලදි.
- පසුගිය ජනවාරි මස 28,29 දෙදින තුල පැවැත්වූ ජාතික සංගමයේ රැස්වීම් කටයුතු සඳහා සහයෝගය ලබා දුන් ගොවි සංවිධානවලට ස්තුතිය පුද කර සිටින බවද පවසන ලදි.

**ගොවි සංවිධානවල අදහස් යෝජනා හා තීරණ**

| ඉදිරිපත් කළ අය | ගැටලුව | විසඳුම |
|---|---|---|
| ගරු සභාපති පුරාණගම ගොවි සංවිධානය ඩබ්.එම්.ඒ.කේ. බී.විජේකෝන් මහතා | -මී ඔය ව්‍යාපාරයේ ඒකාබද්ධ සංවිධානය ඉතාම දුවර්ල මට්ටමක පවතින බවත් රැස්වීම් විධිමත් අයුරින් පවත්වා එය ශක්තිමත් කර ගත යුතු බවත් පවසන ලදි.අවම වශයෙන් මාස තුනකට වරක්වත් ඒකාබද්ධ සංවිධානයේ රැස්වීම පැවැත්විය යුතු බව දක්වන ලදි.<br>- තවද මාස් කන්නයේ අස්වැන්න නෙලීමෙන් අනතුරුව කිරි ඉතිරීමේ කායර් සිදු කල යුතු ආකාරය පිළිබඳවද සාකච්ඡා කල යුතු බවද පවසන ලදි. | එම යොජනාව සුදුසු බවත් අවම වශයෙන් මාස තුනකට වරක්වත් ඒකාබද්ධ සංවිධානයේ රැස්වීම පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කර ගන්නා ලෙස ඒකාබද්ධ සංවිධානයේ නිලධාරීන් හට නේවාසික ව්‍යාපාර කළමණාකරු විසින් දන්වන ලදි. කිරි ඉතිරීමේ කායර් පිළිබඳවද ඒකාබද්ධ ගොවි සංවිධානරැස්වීමේදී සාකච්ඡා කළ යුතු බවද පවසන ලදි. |

මී ලඟට නේවාසික ව්‍යාපාර කළමණාකරු විසින් යල් කන්නයේ වගාව සිදු කිරීමට ප්‍රථම වගා කාල සටහන සහ තීරණ සකස් කර ගැනීම සඳහා අදහස් දැක්වීමට පැමිණ සිටි ආයතන වලට අවස්ථාව ලබා දීම සිදු කෙරිණි.

**02.වාරිමාගර් කටයුතු - ඉංජිනේරු සහකාර**

**අද දිනට ජලාශවල පවතින ජල තත්වය පහත සඳහන් පරිදි දැනුම් දෙන ලදි.**

| ජලාශය | ජල මට්ටම (අඩි) | අක්:අඩි |
|---|---|---|
| අබකොළවැව | 13 | 4400 |
| අතරගල්ල | 11.1 | 1925 |
| පාළුකඩවල | 22.5 | 5420 |

- ජලාශ තුන යටතේ වී වගාවේ දැනට පවතින තත්වය අනුව වගාව සඳහා ජලයේ අවශ්‍යතාවය විමසා බලා ඒ අනුව පහත ආකාරයෙන් ජල මුර ක්‍රියාත්මක කිරීමට සුදුසු බව පවසන ලදි.
- අතරගල්ල,අබකොලවැව,හා පුරාණගම කොටස්වල වගාවන් සඳහා ඉදිරියට එක් අඩු ජල මුරය බැගින්ද පාළුකඩවල දෙවන පියවර සඳහා ජල මුර දෙකක්ද පලමු පියවර සඳහා ජල අවශ්‍යතාවය පිළබඳ තීරණයක් ගැනීම ඉදිරි ජල පාලන කමිටුවේදී සිදු කරණ බවද පවසන ලදි.
- ජලාශවල පවතින ජල මට්ටම් පිළිබඳව අවධානය යොමු කොට ඉදිරි යල් කන්නයේ වගාව පිළිබඳව තීරණයක් ගත යුතු බවට වාරිමාගර් ඉංජිනේරුතුමන් පැවසූ උපදෙස් ලබා දුන් බව පවසන ලදි.
- මාස් කන්නයේ වී වගාව සඳහා ඉදිරියට නිකුත් කිරීමට අපේක්ෂිත ජල මට්ටම් නිකුත් කළ පසු ජලාශ තුනෙහි ඉතිරිවන ජල ධාරිතාවයෙන් වගා කළ හැකි බිම් ප්‍රමාණයන් පිළිබඳව සඳහන් කරණ ලදි.

**ගොවි සංවිධානවල අදහස් යෝජනා හා තීරණ**

| ඉදිරිපත් කළ අය | ගැටලුව | වගකීම | විසඳුම |
|---|---|---|---|
| ගරු සභාපති දකුණු ඉවුර ගොවි සංවිධානය එන්.පී හීන්බංඩා මහතා | -පසුගිය මස පැවති ව්‍යාපාර කමිටුවේදී අබකොලවැව ගොඩ සොරොව්ව නැවත විවෘත නොකිරීමට තීරණය කලද එය නැවත විවෘත කර ඇති බවත් ඒ පිළිබඳව තමන් කණගාටු වන බවද දන්වන ලදි. | වාරි:ඉංජි/ඉංජි:ස හ: | -ගොඩ සොරොව්ව නැවත විවෘත නොකරණ ලෙස වාරිමාගර් ඉංජිනේරුතුමන් දැනුම් දුන් බවත් නැවත ගොවීන් ලිඛිතව සොරොව්ව විවෘත කරණ ලෙස ඉල්ලීම් කළ බැවින් සොරොව්ව විවෘත කිරීමට සිදුවූ බවද අදල ඉංජිනේරු සහකාර මහතා විසින් පවස ලදි. |

**03.ගොවිජන සේවා දෙපාතර්මේන්තුවේ අදහස් දැක්වීම - ප්‍රාදේශීය නිලධාරී**

- 2019 යල් කන්නයට අදාල චක්‍රෙල්ඛයක් මේ වන තෙක් නිකුත් කර නොමැති බවත් දැනට පවතින චක්‍රෙල්ඛයට අනුව පොහොර ලබා දීමේ කටයටුතු සිදු කරණ බවත් නව චක්‍රෙල්ඛයක් නිකුත් උවහොත් දැනුම් දෙන බවත් පවසන ලදි.
- පසුගිය කන්නයේ පොහොර ලබා දීමේදී කොළඹින් මහවට ලබා දී ඉන් පසුව ගල්ගමුවට පොහොර ලබා දුන් බැවින් ගොවීන්ට පොහොර ලබා දීම ප්‍රමාද වූ බවත් මෙම කන්නයේ කොළඹ කොමෂර්ල් පොහොර සමාගමින් සෘජුවම ගල්ගමුවට ගෙන්වීමට කටයුතු කරණ බවට ත් දැන්වීය.
- කෘෂි රක්ෂණය මඟින් වගා හානි ලබා ගැනීමේදී ගං වතුර හානි,නියඟයෙන් වන හානි සඳහා අක්කරයට රු.40000ක මුදලක් ලබා දෙන බවත් එවැනි හානියක් සිදුවූයේ නම් අදාල ඉල්ලුම්පත් කෘ.ප.නි.ස. මහත්වරුන් මඟින් ලබා ගෙන පුරවා භාර දිය යුතු බව පැවසීය.
- වගාවන් සඳහා ගොවිජන බැංකුව මඟින් වාෂරිකව 9% පොලී ප්‍රතිශතයකට රු.50000ක ණය මුදලක් ලබා දෙන බවත් පවසන ලදි.

➢ මාස් කන්නයේ වී අස්වැන්න මිලදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය මේ වන තෙක් වැඩසටහනක් ක්‍රියාත්මක කර නොමැති බවත් ඒ පිළිදව දිස්ත්‍රික් ලේකම් වෙත දැනුම් දිය යුතු බවත් පවසන ලදි.
➢ ගොවිජන සේවා දෙපාතර්මේන්තුව මගින් සංවිධානය කරණු ලබන අලුත් සහල් මංගල්‍යය 2019 මාතර්ු මස අවසන් කාලයේදී ජය ශ්‍රී මහ බෝධිය අභියස පැවැත්වෙන බවත් ඒ සඳහා සහල් මිට බැගින් හෝ ලබා දී දායක වන ලෙසත් දැනුම් දෙන ලදි.

**ගොවි සංවිධානවල අදහස් යෝජනා හා තීරණ**

| ඉදිරිපත් කළ අය | ගැටලුව | විසඳුම |
|---|---|---|
| ගරු සභාපති දකුණු ඉවුර ගොවි සංවිධානය එන්.පී හීන්බංඩා මහතා | -වී වගාවේ 50% ක ප්‍රමාණයම වී කරල් සුදු වී ඇති බවත් ඒ සඳහා කෘෂි රක්ෂණය මඟින් ගෙවීම් කරනු ලබන්නේ නැතිද යන්න විමසීය. | -වන්දි ගෙවනු ලබන්නේ ඉහතින් සඳහන් කල හානි සඳහා පමණක් බවත් වෙනත් හානි සඳහා වන්දි ලබා ගැනීමට නම් අතිරේක රක්ෂණ ක්‍රමයක් ඇති බවත් දැනට එම රක්ෂණයට දායක වී නොමැති බැවින් වන්දි ලබා ගත නොහැකි බව පවසන ලදි. |
| ගරු සභාපති පාළුකඩවල යාය 02 ගොවි සංවිධානය ඒ.ඇන්සලන් අල්විස් මහතා | -මාස් කන්නයේ දී ගොවීන් සඳහා පොහොර ලැබීම නියමිත කාල සීමාවට සිදු කල බැවින් ඒ සඳහා ස්තුතිවන්ත වන බව පවසන ලදි.නව ක්‍රමය යටතේ පවතින පොහොර නාම ලේඛණයේ දෝෂ ඇති බවත් පැරණි පොහොර ඉල්ලුම්පත් ක්‍රමය නැවත ලබා දීම සුදුසු බවත් පවසන ලදි. | -පොහොර ලේඛණය සැකසීම ජාතික වැඩසටහනක් බවත් එය වෙනස් කිරීම අපහසු බවත් හිටපු අමාත්‍යතුමන්ගෙන් ඉල්ලීම් කලද එය ඉටු වූයේ නොමැති බව පවසන ලදි. |
| ගරු සභාපති පාළුකඩවල යාය 05 ගොවි සංවිධානය පී.එම්.ලීලානන් ද වීරසිංහ මහතා | -පොහොර ප්‍රවාහනයේදී වැය වන මුදල පිළිබඳව ගැටළු ඇති වන බවත් ඒ සඳහා සාධාරණයක් ලබා දිය හැකි දැයි විමසීය. | - ඉදිරියේ දී පවත්වන දිස්ත්‍රික් පොහොර කමිටුවේදී එම ගැටළුව ඉදිරිපත් කරණ බවට පවසන ලදි. |
| ගරු සභාපති පාළුකඩවල යාය 03 ගොවි සංවිධානය ඩබ්ලිව්.සුජිත් දිනසේන මහතා | සුළු වාරි යටතට අයත් වන කෝන්වැව ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුව වැව වාන් දමන අවස්ථාවේදී යාය 03 ගොවි සංවිධානයට අයත් අක්කර තුනක පමණ වන කුඹුරු බිම් ප්‍රමාණයක් ජලයෙන් යටවී වගා නොහැකි තත්වයට පත්වී ඇති බවත් එයට හේතුව වැව ප්‍රතිසංස්කරණයේදී වැව් වානෙහි කලින් පැවති අතිරික්ත ජලය පිටවීමේ කවුළුව වසා දැමීම හා වාන ඉස්සීම බවත් අද දින කුඹුරු හිමියන් ව්‍යාපාර කමිටුවට සහභාගී වී සිටින බවත් එම ගැටළුව සඳහා සුදුසු විසඳුමක් ලබා දෙන ලෙසත් ඉල්ලීම් කලේය. | -සුළු වාරි යටතේ ඇති කෝන්වැව ප්‍රතිසංස්කරණය කිරීම සිදු කල බවත් වැවෙහි මිනුම් කටයුතු සිදු කොට මායිම් කණු දැමූ බවත් ප්‍රකාශ කරණ ලදි.තවද වැව ප්‍රතිසංස්කරණයේදී වැව් වාන ඉස්සීම සඳහා මුදල් වෙන් කර නොතිබූ බවත් වාන උස්සා ඇත්නම් වාරිමාගර් ඉංජිනේරුතුමන් එය නැවත සකසා දෙන බවට ප්‍රකාශ කල බවත් ඉදිරියේදී අදාල නිලධාරීන් සමඟ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර වියදමක් ලබා දෙන බවටත් පවසන ලදි. |

**03.කෘෂිකමර් දෙපාතර්මේන්තුවේ අදහස් දැක්වීම - කෘෂිකමර් උපදේශක -ගල්ගමුව**

➢ මාස් කන්නයේ වී වගාවට පලිබෝධ හානිය වැඩි බවත් ඒ පිළිබඳව අවධානයෙන් පසුවිය යුතු බවත් පවසන ලදි.

- සේනා නැමති දළඹු උවදුර ව්‍යාප්තිය වැඩි බවත් හඳුනාගෙන මුල් අවධියේ පාලනය කල හැකි බව පවසන ලදි.
- පළිබෝධ භාවිතය අඩු කල යුතු බවත් භාවිතයෙන් පසු අපද්‍රව්‍ය බැහැර කිරීම පරිසරයට හානි නොවන ආකාරයෙන් විධිමත් ලෙස සිදු කල යුතු බවත් පවසන ලදි.
- ඉදිරි යල් කන්නයේ දී වගා තීරණ ගැනීම වාරිමාගර් දෙපාතර්මේන්තුවේ උපදෙස් මත සිදු කල යුතු බවත් එහිදී ඉපනැල්ලේ මුං වගාව සිදු කරන්නේ නම් මුං බීජ 50% දායකත්වය යටතේ ලබා දිය හැකි බව පවසන ලදි.
- අතිරේක බෝග වගාවක් සිදු කරනවානම් මුං,කව්පි,සෝයා, වැනි බෝග වගාව සඳහා සුදුසු බව ත් වී වගාවකට යොමු වනවා නම් මාස 03 වී සඳහා යොමු වීම සුදුසු බව පවසන ලදි.

මීලගට නේවාසික ව්‍යාපාර කළමණාකරු විසින් ඉදිරි යල් කන්නය පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දුන් අතර එය ජලාශ මට්ටමින් සිදු කරණ ලෙස පවසන ලදි.

- **අබකොළවැව ජලාශය**

  මෙවර අබකොලවැව ජලාශය යටතේ කන්න ඇත්තේ පාරෙන් පහල කොටසට බවත් වාරිමාගර් දෙපාතර්මේන්තුවේ නිදෙර්ශය මත වී වගාව සිදු කිරීම කල හැකි බැවින් අක්කර 420ක බිම් ප්‍රමාණයක වී වගාව සිදු කිරීමට අබකොලවැව ගොවි සංවිධාන 04 ම එකඟ බව ගැමුණු ගොවි සංවිධානයේ ගරු සභාපති කේ.පී. ජයරත්න මහතා පවසන ලදි.

  මීට අමතරව දකුණු ඉවුර ගොවි සංවිධාන බල ප්‍රදේශය තුල අක්කර 37ක බිම් ප්‍රදේශය අතිරේක බෝග වගාව පිහිටුවීමට අවසරය ඉල්ලා සිටි අතර බිමෙහි පවතින තෙතමනයෙන් වගාව පිහිටුවා ගැනීම සිදුකර ජලය අවශ්‍ය උවහොත් මී ඔයෙන් ජලය පොම්ප කර ගැනීම සුදුසු බව දකුණු ඉවුර ගොවි සංවිධානයේ ගරු සභාපති එන්.පී. හීන්බංඩා මහතා පවසන ලද අතර එම අතිරේක බෝග වගාව සඳහා ජලාශයෙන් ජලය නිකුත් නොකිරීමට ව්‍යාපාර කමිටුව තීරණය කරණ ලදි.

- **අතරගල්ල ජලාශය**

  අතරගල්ල ජලාශයේ කන්න මාරු ක්‍රමය යටතේ මෙවර කන්නය පවතින්නේ පාරෙන් පහල කොටසට බවත් (මහසෙන් ගොවි සංවිධානයේ සම්පූණර් කොටසත් ධාතුසේන ගොවි සංවිධානයේ බිම් කොටසින් බාගයක ප්‍රමාණයකුත්)වගාව පිහිටුවන සම්පූණර් බිම් ප්‍රමාණය අක්කර 220ක් ප්‍රමාණයක් වී වගාවට සුදුසු බව අතරගල්ල ගොවි සංවිධානවල තීරණයත් බව පවසන ලදි.
- **පාළුකඩවල ජලාශය**

  පාළුකඩවල ජලාශය යටතේ වම් ඉවුරෙහි අක්කර 400ක බිම් ප්‍රමාණයේ වී වගාව සිදු කිරීමට තීරණය විය.

  පාළුකඩවල පලමු පියවරේ ගොවි සංවිධාන අක්කර 02 ක බිම් ප්‍රමාණය ගොවීන් තිදෙනෙකුට ලබා දෙමින් බෙත්ම ක්‍රමයක් යටතේ වී වගාව සිදු කිරීමට තීරණය විය.එහිදී යාය 01 ගොවි සංවිධානයට අක්කර 50ක් යාය 02 ගොවි සංවිධානයට අක්කර 146ක් යාය 03 ගොවි සංවිධානයට අක්කර 40ක් ලෙස පළමු පියවරේ බෙත්ම යටතේ වී වගාව පිහිටුවන මුළු අක්කර ප්‍රමාණය අක්කර 236 ක් වන බවට තීරණය විය.

  පාළුකඩවල දෙවන පියවරේ ගොවි සංවිධාන අක්කර භාගයක බිම් ප්‍රමාණය එක් ගොවි මහතකුට ලබා දෙමින් අතිරේක බෝග වගාවක් සිදු කිරීමට තීරණය විය.එහිදී යාය 04 ගොවි සංවිධානයට කුඹුරු අක්කර 50ක් යාය 05 ගොවි සංවිධානයට කුඹුරු අක්කර 75ක් යාය 06 ගොවි සංවිධානයට කුඹුරු අක්කර 50ක් ලෙස දෙවන පියවරේ අතිරේක බෝග පිහිටුවන මුළු කුඹුරු අක්කර ප්‍රමාණය අක්කර 175ක් බවට තීරණය විය.

- **2019 යල් කන්නය සඳහා පෙර වගා තීරණ**

මීලඟට නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් ජලාශ තුන යටතේ ඉහත දක්වන ලද බිම් ප්‍රමාණයන් සහ බෝග වගර්වල වගාවන්ට අදාල වගා කාල සටහන සකස් කර ගැනීම සඳහා ව්‍යාපාර කමිටුවට අවස්ථාව ලබා දෙන ලදි.
ඒ අනුව ව්‍යාපාර කමිටුවේ සියලු දෙනාගේ තීරණ මත 1994 අංක 13 දරණ සංශෝධන පනත යටතේ 05 වන වගන්තියේ 05 වන උප වගන්තිය යටතේ මී ඔය ව්‍යාපාරය වෙනුවෙන් 2019 යල් කන්නය සඳහා පහත සඳහන් පරිදි වගා තීරණ ගන්නා ලදි

| අනු අංකය | විස්තරය | තීරණ | | |
|---|---|---|---|---|
| | | අබකොළවැව | අතරගල්ල | පාළුකඩවල |
| 01 | වගා කිරිමට අපේක්ෂිත බිම් ප්‍රමාණය | අක්කර 457 | අක්කර 220 | අක්කර 811 |
| 02 | වගා කිරිමට අපේක්ෂිත බෝග වගර්ය | වී මාස 03 - අක්කර 420 අතිරේක බෝග - අක්කර 37 | වී මාස 03 | වී මාස 03 පුරාණගම - අක්කර 400,පළමු පියවර අක්කර 236. අතිරේක බෝග අක්කර 175 - දෙවන පියවර. |
| 04 | ගොවීන් විසින් ඇළ වේළි නඩත්තුව අවසන් කළ යුතු දිනය | 2019.03.10 ට පෙර | 2019.03.10 ට පෙර | 2019.03.10 ට පෙර |
| 05 | ගොවීන් විසින් නියමිත දිනට නඩත්තු නොකරනු ලැබූ අළවල් ගොවි සංවිධානය විසින් නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2019.03.13 ට පෙර | 2019.03.13 ට පෙර | 2019.03.13 ට පෙර |
| 06 | වාරිමාගර් දෙපාතර්මේන්තුව හා ගොවි සංවිධාන විසින් ප්‍රධාන ඇළවල් /බෙදුම් ඇළවල් නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2019.03.13 ට පෙර | 2019.03.13 ට පෙර | 2019.03.13 ට පෙර |
| 07 | මුල් වරට ජලය නිකුත් කිරිමට යෝජිත දිනය | 2019.03.15 | 2019.03.15 | 2019.03.15 |
| 08 | වපුරා හෝ බීජ සිටුවා අවසන් කළ යුතු දිනය | 2019.04.05 | 2019.04.05 | 2019.04.05 |
| 09 | මුර ජලය ආරම්භ කරන දිනය | ව්‍යාපාර කමිටුවේ තීරණය මත | | |
| 10 | අවසන් වරට ජලය නිකුත් කිරිමට යෝජිත දිනය | 2019.07.20 | 2019.07.20 | 2019.07.20 |
| 11 | යායෙන් ගවයින් ඉවත් කළ යුතු දිනය | 2019.04.05 | 2019.04.05 | 2019.04.05 |
| 12 | වගා රක්ෂනය අවසන් කළ යුතු දිනය | 2019.04.05 | 2019.04.05 | 2019.04.05 |
| 13 | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | 2019.07.20 | 2019.07.20 | 2019.07.20 |
| 14 | අස්වනු නෙලා අවසන් කළ යුතු දිනය | 2019.08.05 | 2019.08.05 | 2019.08.05 |

<u>වගා කොන්දේසි</u>

01 කෙත් ඇල සහ බෙදුම් ඇලවල නඩත්තුව සඳහා කන්නයකට අක්කර 01ක් සඳහා රු.300.00ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.
02 නියමිත දිනට කෙත් ඇලවල් හා බෙදුම් ඇලවල් ගොවීන් විසින් නඩත්තු කළ යුතු අතර නියමිත දිනට නඩත්තු නොකරන කොටස් ගොවි සංවිධානය මගින් නඩත්තු කර නියමිත මුදල ගොවීන්ගෙන් අය කර ගැනමට ගොවි සංවිධානයට බලය පැවරේ.(මීටරයට රුපියල් 150 බැගින්)
03 ගවයින් නිසා වගාවට සිදු වන හානි ගොවිජන සංවධර්න දෙපාතර්මේන්තුවේ මැදිහත් වීමෙන් හානි පූණර්ය කර ගත යුතුයි.වාරිමාගර් පද්ධතියට සිදු වන හානි සඳහා අලාභය තක්සේරු කර අය කර ගැනීමට බලය පවතී.
04 වගා රැස්වීමේ තීරණ වලට පටහැනිව ජලය ලබා ගැනීම හා වාරිමාගර් නිමර්ිතවලට හානි කිරීම සිදු කළ හොත් වාරි මාගර් පනතට අනුව දඩය අය කිරීමටත් එසේම එම හානිය තක්සේරු කර තක්සේරු වටිනාකම අය කර ගැනීමටත් ගොවි සංවිධානයට බලය පැවරේ.
05 අනවසරයෙන් ජලය ලබා ගැනීම වරදක් වන අතර එසේ ලබා ගත් ජලය වෙනුවෙන් වාරිමාගර් දෙපාතර්මේන්තුව මගින් ජලයේ වටිනාකම තක්සේරු කර අදාළ වරදකරුගෙන් අය කර ගැනීමට ගොවි සංවිධානයට බලය පැවරේ.
06 අනවසරයෙන් හෝ බලහත්කාරයෙන් ජල පොම්ප භාවිතයෙන් වාරි ජලය ලබා ගෙන රක්ෂිත හෝ ගොඩ ඉඩම් හෝ අනවසර ඉඩම් වගා කිරීම සම්පූණර්යෙන් තහනම් වේ.

ඒ අනුව 2019 යල් කන්නය සඳහා පෙර කන්න රැස්වීමේ දී ගනු ලැබූ ඉහත තීරණ කන්න රැස්වීමට ඉදිරිපත් කිරීමට සුදුසු බව පුරාණගම ගොවි සංවිධානයේ ගරු සභාපති ඩබ්.එම්.ඒ.කේ.බී.විජේකෝන් මහතා විසින් කළ යෝජනාව පාළුකඩවල යාය 05 ගොවි සංවිධානයේ ගරු ලේකම් එච්.එම්.කරුණාරත්න මහතා විසින් ස්ථිර කරණ ලදි.

ඉහත සඳහන් පරිදි සකස් කර ගත් 2019 යල් කන්නයේ වගා සැලැස්ම අනුව ව්‍යාපාරයේ ඉදිරි කටයුතු සඳහා සූදානම් වන ලෙස සියලු ආයතන වලින් ඉල්ලීම් කරමින් සහ අද දින පෙර කන්න රැස්වීම හා ව්‍යාපාර කමිටු රැස්වීම සාථර්කව පැවැත්වීම සඳහා සහයෝගය දුන් සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මීලග ව්‍යාපාර කමිටු රැස්වීම 2019 මාතර්ු මස 21 වන දින පෙ:ව 9.00ට නේවාසික ව්‍යාපාර කළමනාකරණ කායර්ාලයේදී පැවැත්වෙන බවටද සභාව දැනුවත් කරමින් නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමන් විසින් ප:ව 12.30ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරණ ලදි.

නේවාසික ව්‍යාපාර කළමණාකරු
මී ඔය/උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය

පිටපත්:-

| | |
|---|---|
| 01. වාරිමාගර් කළමනාකරණ අංශය කොළඹ | :- කාදැස |
| 02. දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල | :-කාදැස |
| 03.දිස්ත්‍රික් වාරිමාගර් අධ්‍යක්ෂ කුරුණෑගල | :-අවශ්‍ය කටයුතු සඳහා |
| 04.ප්‍රාදේශීය ලේකම් ගල්ගමුව/අඹන්පොල/ඇහැටුවැව | :-අවශ්‍ය කටයුතු සඳහා |
| 05.ප්‍රාදේශීය වාරිමාගර් ඉංජිනේරු ගල්ගමුව | :-අවශ්‍ය කටයුතු සඳහා |
| 06.ගොවිජන සංවධර්න නියෝජ්‍ය කොමසාරිස් කුරුණෑගල | :-අවශ්‍ය කටයුතු සඳහා |
| 07.ගොවිජන සංවධර්න නිලධාරි ගල්ගමුව/අඹන්පොල ඇහැටුවැව/නාන්නේරිය | :-අවශ්‍ය කටයුතු සඳහා |
| 08.සහකාර කෘෂිකමර් අධ්‍යක්ෂ ගල්ගමුව කලාපය | :-අවශ්‍ය කටයුතු සඳහා |
| 09.සහකාර අධ්‍යක්ෂ කෘෂි රක්ෂණ මණ්ඩලය මහව | :-අවශ්‍ය කටයුතු සඳහා |
| 10.කෘෂිකමර් උපදේශක පාලුකඩවල/අඹන්පොල වන්නි ඉහලගම/ඇහැටුවැව/නාන්නේරිය | :-අවශ්‍ය කටයුතු සඳහා |
| 11.සහකාර කෘෂිකමර් අධ්‍යක්ෂ ප්‍රාදේශීය ලේකම් කායර්ාලය ගල්ගමුව | :-අවශ්‍ය කටයුතු සඳහා |